**ජාතික ක්‍රීඩා අරමුදල - 2025**
**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ජාතික ක්‍රීඩා අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනතේ සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25(4) වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2025 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් ඉක්මවා යාම වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අරමුදලේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 27 වගන්තිය | මෙම වගන්තියේ විධිවිධානවලට පටහැනිව, ශ්‍රී ලංකා යුධ හමුදාව සහ ශ්‍රී ලංකා ඔටොමොබයිල් ක්‍රීඩා සංගමය විසින් 2024 වර්ෂයේදී සංවිධානය කරන ලද Fox Hill Super Cross 2024 තරඟාවලියේ සිදුවූ අනතුර හේතුවෙන් මරණයට පත්වූවන් හා තුවාල ලැබූවන් සඳහා සමාලෝචිත වර්ෂයේදී ගෙවූ රු.250,000 ක් ඇතුලුව රු.12,000,000 ක වන්දි ගෙවා තිබුණි.<br><br>තවද, ජාතික ක්‍රීඩා සභාවේ සභිකයන් සභා වාර සඳහා සහභාගීවීම වෙනුවෙන් රු.715,000ක දීමනා අරමුදලෙන් ගෙවා තිබුණි. | ශ්‍රී ලංකාවේ යම් ක්‍රීඩාවකට ධෛර්ය දීම එය දියුණු කිරීම සහ සංවර්ධනය කිරීම අරමුණු කරගෙන ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය පරිදි මෙම ගෙවීම් සිදු කර ඇත. | අරමුදලේ වියදම් හා ගෙවීම් සිදු කිරීමේදී අදාළ නීති, පනත් හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 26,724,796 ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 102,471,210 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 129,196,006 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුල දී ලැබිය යුතුව පැවති රු. 164,698,562 ක ජාතික ලොතරැයි මණ්ඩලයේ දායකත්වය පෙර වර්ෂය පරිදි නොලැබීම මෙම පිරිහීමට හේතු වී තිබුණි.

**2.2. ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන් ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර වැඩිවීම් වල හෝ අඩුවීම් වල අගයන් එකී ප්‍රතිශතයන් සමග පහත දක්වා ඇත.

| **අදායම් /වියදම් අයිතම** | **සමාලෝචිත වෂර්ය සඳහා වටිනාකම රු.** | **ඉකුත් වෂර්ය සඳහා වටිනාකම රු.** | **වැඩිවීම / අඩුවීම රු.** | **වැඩිවීම % ලෙස** |
|---|---|---|---|---|
| **<u>ආදායම්</u>** | | | | |
| රජයේ ප්‍රදාන | - | 206,272,528 | (206,272,528) | 100 |
| ආයෝජන | 2,696,721 | 2,115,993 | 580,728 | 28 |
| වෙනත් ආදායම් | 9,745,400 | 82,483,914 | (72,738,514) | 88 |
| **<u>වියදම්</u>** | | | | |
| ක්‍රීඩා තරඟ | 35,922,682 | 65,193,481 | 29,270,799 | 45 |
| සුභසාධන හා පුහුණුකරු දීමනා | - | 2,835,631 | 2,835,631 | 100 |
| සංවර්ධන ව්‍යාපෘති | 634,996 | 116,495,138 | 115,860,142 | 99 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 2,609,240 | 3,876,975 | 1,267,735 | 33 |

(අ) ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවලට ධෛර්යය ලබාදීම, ඒවා දියුණු කිරීම හා සංවර්ධනය කිරීමේ අරමුණින් අරමුදල පිහිටුවා තිබුණද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ සමස්ත ආදායම සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා වූ වියදම පිළිවෙලින් සියයට 96 කින් හා 99 කින් අඩු වී තිබුණි. එමඟින් අරමුදල පිහිටුවීමේ ප්‍රධාන අරමුණු ඉටු කිරීම සඳහා අරමුදලේ මූල්‍ය සම්පත් උපයෝජනය කිරීමේ මට්ටම සැලකිය යුතු ලෙස පහළ ගොස් තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) ඉකුත් වර්ෂයේදී සුභසාධන හා පුහුණුකරු දීමනා ලෙස රු.2,835,631 ක් වැයකර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා කිසිදු වියදමක් දරා නොතිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේදී ක්‍රීඩකයින්ගේ සුභසාධනය හා හැකියාවන් වර්ධනය කිරීම සහ පුහුණුකරුවන් දිරිගැන්වීම සඳහා අරමුදලේ මූල්‍ය දායකත්වය ලබාදී නොතිබූ බව නිරීක්ෂණය විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ** අකාර්යක්ෂමතා

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික ක්‍රීඩා අරමුදල මඟින් ක්‍රීඩා උපකරණ ආධාර ලබාදීම සඳහා සමස්ත දිවයිනම ආවරණය වන පරිදි අවශ්‍යතා හඳුනාගෙන, ප්‍රමුඛතා මත ක්‍රීඩා උපකරණ ලබාදීමේ විධිමත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. | විවිධ පාර්ශවයන්ගෙන් ලැබෙන ඉල්ලීම් පරිදි පවතින ප්‍රතිපාදන අනුව ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය පරිදි අදාළ ඉල්ලීම් සඳහා ප්‍රතිපාදන සපයයි. | සමස්ත දිවයිනේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ අවශ්‍යතා විධිමත්ව හඳුනාගෙන, ප්‍රමුඛතා මත ක්‍රීඩා උපකරණ ලබාදීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී අරමුදල මඟින් නෙට්බෝල් ශූරතාවලිය සඳහා ලබාදුන් රු.1,000,000ක ප්‍රතිපාදනයෙන් රු.652,400ක් වැය කර තිබුණද, එම වියදම් සනාථ කිරීම සඳහා නෙට්බෝල් ශූරතාවලියට සහභාගී වූ ක්‍රීඩිකාවන් හා නිලධාරීන් පිළිබඳ විස්තර සහ නිල ඇඳුම් ප්‍රසම්පාදනයට අදාළ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද, ප්‍රතිපාදනයෙන් ඉතිරි වූ රු.347,600ක මුදල නැවත අරමුදල වෙත ලබාගැනීමටද කටයුතු කර නොතිබුණි. | රුපියල් මිලියනයක මුදල ''අධ්‍යක්ෂ ජනරාල් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව'' වෙත 2025.06. 02 වන දින ලබා දී ඇති අතර මේ වන තෙක් ඒ සම්බන්ධයෙන් සවිස්තරාත්මක වියදම් වාර්තාවක් අදාල ඉන්වොයිස් වල සහතික කරන ලද පිටපත් සමඟ අමාත්‍යාංශය වෙත යොමු කර නොමැත. | ලබාදුන් ප්‍රතිපාදන සම්බන්ධයෙන් සවිස්තරාත්මක වියදම් වාර්තා හා අදාළ සාක්ෂි ලබාගෙන, ඉතිරි මුදල් කඩිනමින් අරමුදල වෙත ආපසු ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී තිබූ පරිදි, ජාතික ලොතරැයි මණ්ඩලයේ ලොතරැයිපත් දායක මුදලින් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නිශ්චිත කාර්යයන් සහ ඒ සඳහා අවශ්‍ය වියදම් එම දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීම සඳහා අරමුදල විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ලොතැරැයි ආදායම ජාතික ක්‍රීඩා අරමුදල වෙනුවෙන් වෙන් කර වෙනම පවත්වාගෙන යාමක් සිදු නොකෙරෙන අතර සමස්ථ අනුමත අයවැය තුල අවශ්‍ය අවස්ථාවලදී වියදම් දැරීම සඳහා මුදල් මුදා හැරීම සිදු කරනු ලබයි. | ලොතරැයි දායක මුදල් ඵලදායී ලෙස උපයෝජනය කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නිශ්චිත කාර්යයන් හා ඒ සඳහා අවශ්‍ය වියදම් මහාභාණ්ඩාගාරය වෙත දැනුම් දී අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

## 4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ **සභාගත කිරීම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධනය කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 877(2)(ඇ) ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වී මාස 02ක් ඇතුළත අරමුදලේ සහතික කළ මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, අරමුදල විසින් 2024 හා 2025 වර්ෂ සඳහා අදාළ කාර්යසාධන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | 2024 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව සකස්කර පාර්ලිමේන්තුවේ සභාගත කිරිම සූදානමින් පවතින අතර 2025 වාර්ෂයේ කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | කාර්යසාධන වාර්තා නියමිත කාලසීමාව තුළ සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25(2) වගන්තිය ප්‍රකාරව එක් එක් ලිත් වර්ෂය අවසන් වූ පසු හැකිතාක් ඉක්මණින් අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශයේ ලේකම් විසින් පිළියෙල කළ යුතු වුවද, මෙම වාර්තාවේ දිනය වන විට සමාලෝචිත වර්ෂයට අදාළ පරිපාලන වාර්තාව මෙන්ම පෙර වර්ෂයන්ට අදාළ පරිපාලන වාර්තාද පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදි වර්ෂයේ මුල් කාර්තුවේදි වාර්තාව සකස් කිරිමට කටයුතු කරනු ලැබේ. | ක්‍රීඩා පනතේ 25(2) වගන්තිය ප්‍රකාරව පරිපාලන වාර්තාව නියමිත කාලසීමාව තුළ පිළියෙල කර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |